# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2030/10 - 2017 ජූලි මස 31 වැනි සඳුදා - 2017.07.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2017 අගෝස්තු මස 01 වැනි දින සිට මෙහි උපලේඛනයේ III වන තීරයේ සඳහන් කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2017.05.08 දිනැති අංක 2018/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් දක්වා ඇති මසුන්ගෙන් සංයෝජිත වර්ගීකරණ අංක 0303.89.90 යටතේ වර්ගීකරණය වන තලපත් සහ කොප්පරා මසුන් සඳහා ප්‍රකාශිත අදාළ නියමය 2017 අගෝස්තු මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2017 ජූලි මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* | *III වැනි තීරය* |
|---|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* | *කාල සීමාව* |
| | *සං. ව.* | *සං. ව. ශීර්ෂය* | *විස්තරය සංකේතය* | | |
| 01 | 03.03 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායිත මසුන් | | |
| | | 0303.89.90 | අනෙකුත් - තලපත් (Istiophorus platypterus) සහ කොප්පරා මසුන් (Makaira spp) පමණක් | කි. ග්‍රෑමයට රු. 25/- | බලාත්මක දිනයේ සිට මාස 03 කාලයක් දක්වා |
| 02 | 10.05 | 1005.90 | අනෙකුත් - බඩ ඉරිඟු | කි. ග්‍රෑමයට රු. 10/- | බලාත්මක දිනයේ සිට මාස 06 කාලයක් දක්වා |

08 - 594